# 1889 දී කර්නල් එච්.එස්. ඕල්කොට් සහ අනගාරික ධර්මපාලතුමාගේ ජපන් සංචාරය හා එහි ප්‍රතිඵල පිළිබඳ ඇගයීමක්

**දයා එදිරිසිංහ**[1]

*[1]බෞද්ධ අධ්‍යයන පීඨ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම, ශ්‍රී ලංකාව.*

**ambagaha@yahoo.com*

වර්ෂ 1889 පෙබරවාරි නවවෙනි දින සිට මැයි දාහතර වෙනි දින දක්වා ඕල්කොට්තුමා සහ අනගාරික ධර්මපාලතුමා ජපානයෙහි සංචාරයක නිරත විය. මෙම සංචාරයෙහි මූලික අභිප්‍රාය වූයේ ශ්‍රී ලංකාවේ බෞද්ධ කටයුතු සඳහා ජපානයේ මහායාන බෞද්ධයන්ගේ සහයෝගය ලබා ගැනීම ය. මේ පිළිබඳ විස්තර ධර්මපාල තුමාගේ 1889 වර්ෂයේ දින පොතෙහි වාර්තා වී ඇත. ජපන් සංචාරයේ දී එතුමා රෝගාතුර වුව ද සංචාරයේ වැඩ කටයුතු සාර්ථක ව ඉටු කරගත් අතර මෙහිදී ජපන් බෞද්ධ නායකයන් හා සමඟ සාකච්ඡා කොට වැදගත් තීරණවලට එළඹීමට ද හැකි වී තිබේ. කියෝතෝවේ දී ජපන් බෞද්ධ නිකාය නියෝජනය කරනු ලැබූ සියලු බෞද්ධ හිමිවරුන් සමඟ එක් ව කතිකා කොට ගෙන බෞද්ධ විශ්වවිද්‍යාලයක් පිහිටුවීමටත්, ඒ සඳහා මුදල් විහාරස්ථානවලින් සපයා ගැනීමට ද තීරණය විය. ජපානයේ බෞද්ධ භික්ෂූන් අතර සමගිය ගොඩනගා ගැනීමට හැකිවීම සාර්ථක ප්‍රතිඵලයකි. පොදුවේ බෞද්ධ කොඩියට ගරු කිරීමට එකඟ විය. තෙන්දායි විහාරස්ථානයේ දොරටුවේ ඔවුන් පිළිගැනීමට බෞද්ධ කොඩිය එල්ලා තිබුණි. මෙය බෞද්ධ ජනතාවගේ ප්‍රමෝදයට හේතු විය. බෞද්ධ ශිෂ්‍යයන්ට බුදුදහම ඉගෙනීමට උනන්දුවක් ඇති විය. කියෝටෝහි චියෝජින් විහාරස්ථානයේ පැවති රැස්වීමෙන් මේ බව සනාථ විය. මේ රැස්වීමේ දී ඕල්කොට්තුමා විසින් දේශනයක් පවත්වනු ලැබීය. පාලි හා සංස්කෘත භාෂා ඉගෙනීමට ජපානයේ උගතුන් අතර උනන්දුවක් ඇති විය. එවකට ජපානයේ සිටි එක ම සංස්කෘත පඬිවරයා නම් බුනියින් නන්ජියෝ පමණි. ධර්මපාලතුමා සිංහලයෙන් බෞද්ධ ගාථා ලියා ජපන් සිසුන්ට බෙදා හැරියේ ය. මෙම සංචාරයේ දී ඕල්කොට්තුමාට විදේශ රටවල සිට පැමිණි සිසුන් හා බෞද්ධ නායකයින්ගේ ද පරම විඥානාර්ථ සමාගමට සම්බන්ධ වූවන්ගේ ද සහාය බෞද්ධ කටයුතු සඳහා ලබා ගත හැකි විය. හෝගන්ජි විහාරස්ථානයේ ඕල්කොට්තුමා හා ධර්මපාලතුමා එක් දින පන්තියක් පවත්වා ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු අනාවරණය කළහ. ඔසාකාහි ද බෞද්ධ බාලිකා හා පිරිමි පාසල් නැරඹීමට ගිය අතර ඉන් ලබා ගත් අත්දැකීම ශ්‍රී ලංකාවේ දී භාවිත කිරීමට අවස්ථාව යොදා ගත්තේ ය. මෙවන් මහඟු ප්‍රතිඵල ලද මෙම ජපන් සංචාරය ජපානයට මෙන් ම ශ්‍රී ලංකාවට ද අතිශයින් ම වැදගත් වූවක් විය.

මුඛ්‍ය පද ඃ තෙන්දායි විහාරස්ථානය, හෝගන්ජි විහාරස්ථානය, කියෝටෝ, ජපන් බෞද්ධ නිකාය, මහායාන බෞද්ධයන්